# දඟකාර හා පැටවා



නෙතුලි දෙනෙත්මා රත්නායක

# දඟකාර හා පැංචා

නෙතුලි දෙනෙත්මා රත්නායක

දඟකාර හා පැංචා

නෙතුලි දෙනෙත්මා රත්නායක

කර්තෘ ප්‍රකාශනයකි


| | |
|---|---|
| පාසල | : මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පන්තිය | : 3 ශ්‍රේණිය E |
| ප්‍රථම මුද්‍රණය | : 2026 |
| **ISBN** | **: 978-624-211-269-5** |

# පිදුම

අ යන්නෙන් පටන් ගෙන

ජීවිතය දිනන්නට පාර පෙන්වූ

මාගේ පළමු හා දෙවැනි ශ්‍රේණියේ ගුරුතුමිය වන

ගයානි ජයසුන්දර ගුරු මෑණියන්ට

ඉතා ආදරයෙන්

මෙය පුදමි.

# පෙරවදන



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

දඟකාර හා පැංචා

එකෝමත් එක්ක කැලෑවක හා පවුලක් ජීවත් වුණා. මේ හා පවුලේ අම්මයි, තාත්තයි, හා පැංචෙකුයි හිටියා. මේ හා පැංචා හරිම දඟකාරයි. මේ තුන්දෙනා කැලෑවේ ගල්ගුහාවක සතුටින් ජීවත් වුණා.



දවසක් හා පැංචා සහ අම්මාගෙන් ඇහුවා "අම්මේ අපි කෑම කන්න ගේන්නේ කොහෙන්ද" කියලා.

"පුතේ, අපි කෑම කැලෑවට ගිහින් පුතාට ගෙනත් දෙනවා" කියලා අම්මා කිව්වා. "ඉතින් අම්මේ, මමත් ගිහින් කෑම අරන් එන්නම් හෙට" හා පැංචා කිව්වා.

"එපා එපා" අම්මා කිව්වා.

මේ දඟකාර හා පැංචා "ඇයි අම්මේ එපා කියන්නේ?" කියලා අම්මාගෙන් ඇසුවා.

"පුතේ, මේ කැලෑවේ අපිව අල්ලන්න බලාගෙන හුගාක් සත්තු ඉන්නවා. පුතා තනියම යනකොට මොනවා හරි උනොත් මොකද වෙන්නේ?" අම්මා කිව්වා.



මේ දඟකාර හා පැංචා එදා රෑ කල්පනා කළේත් හෙට කොහොමද කෑම හොයන්න කැලෑවට යන්නේ කියලා. "අම්මා මට යන්නත් එපා කියනවා, මට මේ ගුහාවේ ඉඳලා ඇතිවෙලා. නෑ හෙට මම කෑම හොයන්න කැලෑවට යනවා" කියලා හිතාගෙන හා පැංචා නිදා ගත්තා.



පහුවදා උදේ හා පැංචා අම්මාටයි තාත්තාටයි හොරෙන් කැලෑවට ගියා. ටික දුරක් යනකොට හා පැංචාට රසම රස එළවළු වත්තක් හම්බ වුණා.

"මෙතන හුඟාක් එළවළු තියනවා නේ. මම මේවා කාලා අම්මාටයි තාත්තාටයි අරන් යනවා" කියලා හිතාගෙන මේ හා පැංචා කන්න පටන් ගත්තා.



මේ හා පැංචා කෑම කාලා ඉවර වෙලා ගුහාවට යන්න පිටත් වුණා. ටික දුරක් යද්දික් ගොරවන සද්දයක් ඇහිලා පස්ස හැරිලා බලද්දි ලොකු සිංහයෙක් මේ හා පැංචාගේ පිටිපස්සෙන් එනවා දැක්කා. "අම්මා මට කියපු දේ ඇත්තනේ" කියලා මේ හා පැංචාට හිතුණා.



මම කොහොම හරි දුවලා පණ බේරගන්න ඕනේ" කියලා හිතාගෙන මේ හා පැංචා පස්ස බලන්නේ නැතුව දුවන්න ගත්තා. සිංහයාත් හා පැංචාව අල්ල ගන්න වේගයෙන් දුවන්න ගත්තා. "මම දුවලා කොහොම හරි ගුහාවට රිංගා ගන්න ඕනේ" හාවා තව හයියෙන් දුවන්න ගත්තා.



අම්මයි තාත්තයි හැමතැනම මේ හා පැංචාව හොයන්න ගත්තා. මේ දඟකාර හා පැංචා හොයන්න අම්මයි තාත්තයි හුගක් මහන්සි වුනා.



ටික දුරක් යනකොට මේ දෙන්නා දකිනවා හා පැංචා වේගයෙන් දුවන් එනවා. "අම්මේ තාත්තේ අපි ඉක්මනින් යමු මගේ පිටිපස්සෙන් සිංහයෙක් එනවා, අපි ගුහාවට දුවමු"

හා පැංචාගේ තාත්තා හා පැංචාව පිට උඩට අරන් හා පැංචාගේ අම්මාත් එක්ක හයියෙන් දුවන්න ගත්තා.

කොහොම හරි දුවලා මේ තුන්දෙනා සිංහයාගෙන් බේරිලා ගුහාවට ආවා.



අම්මයි තාත්තයි මේ  දඟකාර හා පැංචාට හොඳටම බැන්නා. "මට සමාවෙන්න, මම ආයි මේ වගේ වැඩ කරන්නෙ නෑ. අම්මයි තාත්තයි කියන දේ අහගෙන ඉන්නවා" කියලා හා පැංචා කිව්වා.



මේ දඟකාර හා පැංචා අම්මා තාත්තා කියන දේ අහගෙන සතුටින් කාලය ගත කලා

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)